අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

සියලු ම හිමිකම් ඇවිරිණි. All rights reserved. அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை.

| ප්‍රාථමික අංශය | සිංහල භාෂා හා සාහිත්‍යඥාන | කාලය පැය - 03 යි. |
|---|---|---|

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ii හා iii කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

**01 .** (අ) කෙටි පිළිතුරු සපයන්න.

i. නූතන සිංහල අක්ෂර මාලාවේ හ්‍රස්ව ස්වර නම් කරන්න.
ii.නූතන සිංහල අක්ෂර මාලාවේ දීර්ඝ ස්වර නම් කරන්න.
iii. නූතන සිංහල අක්ෂර මාලාවේ නාම්‍ය ස්වර නම් කරන්න.
iv. අර්ධ ස්වර නම් කරන්න.
v. සන්ධ්‍යක්ෂර නම් කරන්න.
vi. ‘ක’ වර්ගය නම් කරන්න.
vii. මහාප්‍රාණාක්ෂර නම් කරන්න.
viii. නාසික්‍යාක්ෂර නම් කරන්න.
ix. සඤ්ඤකාක්ෂර නම් කරන්න.
x. අන්තඃස්ථාක්ෂර නම් කරන්න. ( ලකුණු 2 x 10 = 20 )

(ආ) කෙටි පිළිතුරු සපයන්න.

i. අ + ඉ එක්වීමෙන් සැදෙන ස්වරය නම් කරන්න.
ii. අ + ඊ එක්වීමෙන් සැදෙන ස්වරය නම් කරන්න.
iii. අ + එ එක්වීමෙන් සැදෙන ස්වරය නම් කරන්න.
iv. අ + උ එක්වීමෙන් සැදෙන ස්වරය නම් කරන්න.
v. අ + ඌ එක්වීමෙන් සැදෙන ස්වරය නම් කරන්න.
vi. අ + ඔ එක්වීමෙන් සැදෙන ස්වරය නම් කරන්න.
vii. **තුරුණු** මෙහි අන්තර්ගත පිල්ලම් නම් කරන්න.
viii. ගැටය සහිත ඇලපිල්ල යෙදුණු අකුරක් මුලට යෙදුණු වචනයක් ලියන්න.
ix. රකාරාංශය සහිත වචනයක් ලියන්න.
x. ණ් + ඉ මෙම ස්වර ව්‍යංජන අක්ෂර දෙක එක් කොට ලියන්න. ( ලකුණු 2 x 10 = 20 )

### ii කොටස

**02.** (අ) පහත දැක්වෙන වචනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කොට ලියන්න.

I . ප්‍රසස්ති ii . පිලිබඳ iii. ආහාශය Iv. ආමන්ත්‍රන V. අනහිමුක (ලකුණු 05)

(ආ) පහත සඳහන් පද අකාරාදි පිළිවෙළට ලියන්න.

I . කඩුවෙල ii . මොනරාගල iii. ගාල්ල Iv. අම්පාර V. පානදුර (ලකුණු 05)

(ඇ) ඉස්පිල්ල, පාපිල්ල, රකාරාංශය, ගැටය සහිත ඇලපිල්ල, ඇදපිල්ල ඇතුළත්වන පද එක බැගින් ලියන්න. (ලකුණු 05)

**03.** (අ) පහත සඳහන් පද විසන්ධිකර ලියන්න.

I . ගුරූපදේශ ii . මහෝපකාරී iii. ඉන්නල Iv. ලිග්ගල v. රුක්කත්තන (ලකුණු 05)

(ආ) පහත සඳහන් සමාස පද කවර සමාසයකට අයත් දැ යි නම් කරන්න.

I . දුදන ii . කිරිබත් iii. මල්සිනහව Iv. දිනකර v.ගස්වැල් (ලකුණු 05)

(ඇ) පහත සඳහන් තද්ධිත නාමවල ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන් කරන්න.

I . පුතණු ii . උපාසිකා iii. ප්‍රදේශීය Iv. තොටි v. නැකති (ලකුණු 05)

**04 .** (අ) පහත සඳහන් ක්‍රියා පද නම් කරන්න.

I . දුවද්දී ii . බලවයි iii. රඟමින් Iv. බැස v. නට නටා (ලකුණු 05)

(ආ) පහත සඳහන් කෘදන්ත නාමවල ධාතු ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන් කරන්න.

I . නැටිලි ii . රැකුම් iii. බලන Iv. කියමන් v. කිරීම (ලකුණු 05)

(ඇ) පහත සඳහන් නාම පදවල ප්‍රකෘතිය දක්වන්න.

I . වලසා ii . තරුව iii. පුටුව Iv. කන්ද v. මිනිස්සු (ලකුණු 05)

## iii කොටස.

**05.** (අ) පහත සඳහන් ප්‍රකාශයන්ට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

i. යමෙකුට නිෂ්ප්‍රයෝජන දෙයක් දීම
ii. යමක් ඉතා පහසුවෙන් ඉටු කිරීම.
iii. නොගැළපෙන දෙදෙනෙක් එකට වැඩ කිරීම
iv. ඉතා දුෂ්කර කටයුත්තක්
v.උපකාර ගෙන අමතක කිරීම (ලකුණු 05)

(ආ) පහත සඳහන් පදවල විරුද්ධාර්ථ පදය ලියන්න.

I . යහපත් ii . ලෞකික iii. ආනයන Iv. උත්තම v. ඇත (ලකුණු 05)

(ඇ) පහත දැක්වෙන පද තනිවචනයෙන් ලියන්න.

I . සිත, කය, වචනය
ii . හිස නැති මළ කඳ
iii. ඇස, කන, නාසය, දිව, ශරීරය
Iv. බුදුසරණ, දම්සරණ, සඟසරණ
v. ආහාරපාන දුර්ලභ අවස්ථාව (ලකුණු 05)

**06.** (අ) පහත සඳහන් වාක්‍ය නිවැරදි කර ලියන්න.

I . ගුරුවරුන් අවවාද දෙති.
ii . කෙනෙක් ඊට පක්ෂ විය.
iii. සඟගණ අරමෙහි වසයි.
Iv. කාන්තාවක් දරුවෙක් නළවයි.
v. ඔවුහු හෙට පැමිණේවි. (ලකුණු 05)

(ආ) පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

I . ගොවියා කුඹුර කොටයි.
ii . අම්මා අවවාද දෙයි.
iii. මල්ලී මල් පූජා කරයි.
Iv. අච්චී ජාතක කතාවක් කිව්වා ය.
v. රජතුමා රට පාලනය කළේ ය. (ලකුණු 10)

**07**. පහත සඳහන් මාතෘකා අතුරින් 3කට කෙටි සටහන් ලියන්න.

i. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
ii. සිංහල ජාතක පොත
iii. සද්ධර්මරත්නාවලිය
iv. ගුත්තිල කාව්‍යය
v. දඹදෙණි සාහිත්‍ය යුගය

(ලකුණු 15)